සබරගමුව පළාත් සභාව - சப்பிரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாசார நடவடிக்கைகளுக்கான அமைச்சு
Ministry Of Education, Information Technology & Cultural Affairs
Email//:edusabaram@gmail.com Facebook//:SabEducationMinistry

මගේ අංකය / எனது இல / My Number: ME/E/03/18
ඔබේ අංකය / உமது இல / Your Number:
දිනය / திகதி / Date: 2018.12.05

පළාත් අධ්‍යාපන චක්‍රලේඛ
අංක - සබර/2018/09

සබරගමුව පළාතේ, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියළුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, සියළුම විෂය අධ්‍යක්ෂවරුන්,

**<u>වාර විභාග කාල සටහන් සකස් කිරීම හා වාර විභාග කාල සීමාව තුළ විදුහල්පතිවරුන්ට හා ගුරුභවතුන්ට වෙනත් රාජකාරී පැවරීම පිළිබඳව.</u>**

සබරගමු පළාතේ සියළුම පාසල් වලට අදාලව වාර විභාග පැවැත්වීම, ඊට අදාල කාල සටහන් සකස් කිරීම හා වාර විභාග පැවැත්වෙන කාල සීමාව තුළ විදුහල්පතිවරුන්හට හා ගුරුභවතුන්හට වෙනත් රාජකාරී පැවරීම, පිළිබඳව පහත සඳහන් නියමයන් හා කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව මෙයින් දැඩි ලෙස අවධාරණය කරනු ලැබේ.

I. අදාල වාර විභාග කාලසටහන් සකස් කිරීමේදී සෑම වාරයකම අවසාන දිනට (වාර නිවාඩුව ලබා දෙන දිනට) සතියකට පෙර වාර විභාග අවසන් වන පරිදි විභාග කාල සටහන් සකස් කිරීමත්, ඒ අනුව වාර විභාග පවත්වා අවසන් කිරීමත් සිදුකළ යුතුය.

II. වාර විභාග පැවැත්වෙන කාල සීමාව තුළ කිසිදු හේතුවක් මත විදුහලපතිවරුන් හා ගුරුභවතුන් සඳහා පුහුණු සැසි, සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම නොකල යුතුය.

III. වාර විභාග සඳහා සකස් කරනු ලබන විභාග කාල සටහන් වාර විභාගය පැවැත්වීමට සති දෙකකට ප්‍රථම සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර මාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම අනිවාර්ය වේ.

02. උක්ත උපදෙස් තරයේ පිළිපැදිය යුතු බව වැඩිදුරටත් මෙයින් අවධාරණය කරමි.

මහින්ද එස්. වීරසූරිය,
ලේකම්,
අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත.

මහින්ද එස්. වීරසූරිය
ලේකම්
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව,
නව නගරය - රත්නපුර.

Ministry of Provincial Education ★ Sabaragamuwa ★

පිටපත් :
1. ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත. - කාරුණික දැ.පි.
2. ආණ්ඩුකාරවර ලේකම්, සබරගමුව පළාත. - කාරුණික දැ.පි.
3. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සියළුම මාණ්ඩලික නිලධාරීන්.
4. ප්‍රධාන ගණකාධිකාරී ඇතුළු සියළුම ගණකාධිකාරීවරුන්.
5. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, සබරගමුව පළාත් සභාව.
6. විගණන අධ්‍යක්ෂ, රත්නපුර/කෑගල්ල.
7. සබරගමුව පළාතේ සියළුම විදුහල්පතිවරුන්.

ගරු අමාත්‍යතුමා / Hon.Minister: Office-045-5623222,045-2287306 Residence-045-2222538 Mobile-077-9102001
අමාත්‍යාංශ ලේකම් / Secretary: Office-045-2223015 Residence-045-2232985 Mobile-071-4402000
කාර්යාලය / Office: නවනගරය,රත්නපුර. Newtown,Rathnapura. Office-045-2222542